# භාෂාව සහ ඥානන විද්‍යාව

ආචාර්ය සුනිල් කාරියකරවන

This paper presents a brief examination of the theory of language put forward and developed during the past three decades by Noam Chomsky as a possible solution to the famous question posed by Plato and most clearly articulated by Bertrand Russell; "How come it that human beings, whose contacts with the world are brief and personal and limited, are nevertheless able to know as much as they do know? " In certain domains of thought and understanding, our knowledge is vast in scope and highly specific and richly articulated in character and in large measure shared with others who have similar backgrounds and experience. The problem, in otherwords, is to account for the specificity and the richness of the cognitive systems that arise in the individual on the basis of the limited information available. " In this article, We will assess in some detail the validity of Chomsky's approach to the Plato's problem.

දාර්ශනිකයන් මවිතයට පත්කළ ප්ලේටෝගේ සුප්‍රසිද්ධ ගැටලුව බර්ට්‍රන් රසල් විස්තර කළේ මෙසේයි :

'ලෝකය සමග ඉතා කෙටි වූත් සීමිත වූත් සම්බන්ධතා පවත්වන මානවයා මෙතරම් විශේෂිත වූත් අසීමිත වූත් දැනුම් සම්භාරයක් ස්වායත්ත කරගන්නේ කෙසේද? එම දැනුම් සමානයන් සමග හුවමාරු කරගන්නේ කෙසේද?'

මානවයා සතු සෙසු ඥානන පද්ධතීන් (cognitive systems) ගැන දැනුම් සම්බන්ධයෙන් ද මෙම ප්‍රශ්නය එසේම අදාළය. ඇදහීම් සහ බලාපොරොත්තුමය ඥානන පද්ධතිය ගැන සිතා බලන්න. අත්දැකීම් ගොනු කිරීම සහ අර්ථකථනය කිරීම ගැන සලකා බලන්න. මේ හැම ඥානන පද්ධතියක් සම්බන්ධවම සලකා බැලීමේ දී අප සතු දැනුම් සම්භාරය අප්‍රමාණ වේ. මෙකී ප්‍රභවය කුමක්ද? එතරම් දැනුම් සම්භාරයක් ස්වායත්ත කර ගැනීමට අප සතු ශක්‍යතාව කුමක්ද?

මෙම ප්‍රශ්නය තවතවත් තීව්‍ර වන්නේ ප්‍රෝත්සාහනයෙහි ඌනතාව (poverty of stimulus) ගැන සලකන විටය. එනම් අපේ ඥානන පද්ධතීන් සැබැවින්ම අපේ අත්දැකීම් යම් පමණකට පිළිබිඹු කළත් අප ලබන අත්දැකීම්වල ප්‍රමාණය සහ ඒ මගින් අප සතුකර ගන්නා දැනුම් සම්භාරය ගැන සලකන විට ඒ අතර පරතරය අතිවිශාල බව සැබැවින්ම පැහැදිලිය.